ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

**<u>පුවත්පත් නිවේදනය</u>**

## <u>කච්චතිව් ශාන්ත අන්තෝනි දේවස්ථානයේ වාර්ෂික මංගල්‍යය ඉන්දීය බැතිමතුන්ගේ සහභාගීත්වයෙන් පැවැත්වේ</u>

ප්‍රධාන වශයෙන්ම ධීවරයන් සහ පියතුමන්ලා ඇතුළු 100කට ආසන්න ඉන්දීය බැතිමතුන් පිරිසක් 2022 මාර්තු 11-12 දෙදින කච්චතිව් ශාන්ත අන්තෝනි දේවස්ථානයේ පැවති වාර්ෂික මංගල්‍යය ස ඳහා සහභාගී වූහ. ශ්‍රී ලංකාවෙන් ද ඒ හා සමාන බැතිමතුන් සංඛ්‍යාවක් මේ සඳහා සහභාගී වූහ. යාපනයේ ඉන්දීය කොන්සියුලර් ජෙනරාල් රාකේෂ් නටිරාජ් මහතා සහ කොන්සියුලර් ජෙනරාල් කාර්යාලයේ නිලධාරිහු විශේෂ ආරාධිත අමුත්තන් වශයෙන් මේ සඳහා සහභාගී වූහ.

2. ශ්‍රී ලංකා ධීවර අමාත්‍ය ඩග්ලස් දේවානන්ද මහතා දිවයිනට පැමිණි ඉන්දීය බැතිමතුන් පිළිගත්තේය. මංගල්‍යය නිමිත්තෙන් බැතිමතුන් සඳහා පැවති විශේෂ යාඥාවකින් අනතුරුව එදිනම පස්වරුවේ දේව මෙහෙය පැවැත්විණ. ධීවරයන් භාර ශාන්තුවරයා වන පාදුවාවේ ශාන්ත අන්තෝනි මුනිඳුට කැප වූ විශේෂ මෙහෙයක් 2022 මාර්තු 12 වන දින ඉන්දීය සහ ශ්‍රී ලංකා පියතුමන්ලා විසින් පවත්වන ලදී. ඉන් අනතුරුව සාම්ප්‍රදයික මංගල්‍යය පැවැත්විණ. සැමරුම් මාලාවේ කොටසක් වශයෙන් දේවස්ථානයේ කොඩිය ද ඔසවන ලදී.

3. ඉන්දීය බැතිමත්හු මෙම වාර්ෂික මංගල්‍යය සඳහා සෑම වසරකම මහත් උනන්දුවකින් සහභාගී වෙති. 2020 වසරේදී ඉන්දීය බැතිමතුන් 3000කට අධික සංඛ්‍යාවක් මේ සඳහා සහභාගී වූහ. මෙම බැතිමතුන් සඳහා යාපනයේ ඉන්දීය කොන්සියුලර් ජෙනරාල් කාර්යාලය කොන්සියුලර් සහ වෙනත් සහය ලබා දේ. කොවිඩ්-19 වසංගතය හේතුවෙන් පසුගිය වසරේදී මංගල්‍යය නොපැවැත්විණ. කොවිඩ් මාර්ගෝපදේශයන්ට අනුකූලව පැවති මෙවර මංගල්‍යය සඳහා සීමිත පිරිසකට අවසර හිමි විය.

4. මෙම මංගල්‍යය ඉන්දීය සහ ශ්‍රී ලාංකික ජනතාව අතර පවතින ශක්තිමත් සබඳතා සහ දිගු කාලීන සංස්කෘතික බැඳීම් පිළිඹිබු කරයි. දෙරට ධීවරයන්ගේ සහභාගීත්වය ඔවුන් අතර සමීප අන්තර් ක්‍රියාකාරකම් සඳහා ද එකිනෙකා දැන හඳුනා ගැනීමට සහ එකිනෙකාගේ ප්‍රශ්න සහ ගැටළු පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට ද අවස්ථාව ලබා දේ. සියවස් ගණනාවක් පැරණි සබඳතාවයේ ප්‍රධානතම අංගය වී ඇත්තේ සමීප සමුද්‍රීය අසල්වැසි රාජ්‍යයන් දෙකෙහි ජනතාව අතර පවතින මෙවැනි අන්තර් ක්‍රියාකාරකම් සහ සමීප බැඳීම් ය.

***

***කොළඹ***
***2022 මාර්තු 12***